# තුංමංසල www.thummansala.com

## ''තොරතුරු ලත් සැණින් ඔබට''



## උදය ගෝවින්න

තුංමංසල වෙබ් අඩවියට අවුරුදු තුනක කාලයක් ළං වෙලා. තුංමංසල සමඟ විශාල පිරිසක් මේ වන විට එක්වෙලා තිබෙන බව එහි නිර්මාතෘ උයද ගෝවින්න මා සමඟ පැවසුවා. මේ වන විට දවසකට තුං මංසලට ගොඩවෙන රසික පිරිස විසිදාහත් පනස්දාහත් අතර පිරිසක් වෙලා. ඒ අතර ඕස්ට්‍රේලියාව එංගලන්තය ඇමරිකාව ඇතුළු යුරෝපීය රටවල් වල සිටින ශ්‍රී ලාංකිකයන් සිටිනවා. උයද ගෝවින්න සමඟ අද අපි මුහුණට මුහුණෝන් හමු වෙමු.

**ශ්‍රීනාත්**
තුංමංසල ආරම්භ කරන්න හිතුණෙ ඇයි?

**උදය**
මගේ පරිහරණය සඳහා සියලුම මාධ්‍ය සඳහා සම්බන්ධතා ඇති මගේම පුද්ගලික වෙබ් පිටුවක් මම හදාගෙන පරිහරණය කරමින් හිටියා. මට අවශ්‍ය සියලුම දේ මම මේ වෙබ් පිටුවට ඇතුල් කරලා තිබුණා. වෙන වෙන වෙබ් පිටු වලට යන්නෙ නැතිව මට අවශ්‍ය කරන අනෙක් වෙබ් අඩවි වලට පිවිසෙන්න මට මගේ මේ වෙබ් පිටුවෙන් මම පහසුකම් හදාගෙන තිබුණා. මම තනියම මේ පහසුකම ගන්න ගමන් මට හිතුණා අනෙත් අයටත් මේ අවස්ථාව දෙන්න. ඒ අනුව 2005 ජූනි 2 දා හැමෝටම බලන්න පුලුවන් වන විදිහට තුංමංසල පටන් ගත්තා. ජගත් ජේ එදිරිසිංහ චරිත දිසානායක තේජා කටුගම්පොල මෙයට මුලින් උපකාර කළා. මං ඒ ගැන මතක් කරන්න කැමතියි. ඊට මාස තුනකට පස්සෙ ඒ කියන්නෙ 2005 අගෝස්තු මාසෙ 3 වෙනිදා වෙබ් ගුවන් විදුලිය පටන් ගත්තා. ශ්‍රීනාත්ට මතකද මේකට ඔබත් ඔබේ බිරිඳ ශ්‍රියානිත් උදව් කළ හැටි. මෙහිදී මට ඉහත මා කිව් තුන්දෙනා සමඟ විජය කරුණාසේන සිසිර දිසානායක රවි කරවිදෙනිය ඔල්ගා කරවි-දෙනිය උදව් කළා. රවි සිරිවර්ධන දයා ලංකාපුර කුසුම්චන්ද්‍ර අරංගල මයුරි අබේසිංහ හද්‍රා කරුණාරත්න සුරේන්ද්‍ර තිලකරත්න යන යන අය දුන් සහයෝගයත් මතක් කරන්න කැමතියි. මෙයට අමතරව තව විශාල පිරිසක් උදව් කළා. ඒ හැමෝටම ස්තුති කරන්න කැමතියි.

**ශ්‍රීනාත්**
උදයට මතකද  තුංමංසල වෙබ් ගුවන් විදුලිය පටන්ගත්ත කාලෙ දුක් විඳපු හැටි එහෙම?

ඔබ මාවත් ගුවන් විදුලි ප්‍රවෘත්ති කියන්න හවුල් කරගත්ත හැටි මටත් මතකයි.

**උදය**
ඒ කාලේ වෙච්ච කැපවීම ගැන මට සතුටුයි. ඒකයි මම මුලින්ම කිව්වෙ අවුරුදු තුනක් වැනි කාලෙකදි මේ තරම් පිරිසක් මෙය වැළඳ ගත්තෙ.

**ශ්‍රීනාත්**
මොකද මේකට තුංමංසල කියලා නම දැම්මෙ?

**උදය**
ඒක අපූරු සිදුවීමක්. මම ලංකාවෙ ඉන්දැද්දි රැකියාවට අමතරව ජනමාධ්‍යයට සම්බන්ධව සිටියා. ටෙලි නාට්‍ය කීපයක සහය අධ්‍යක්ෂවරයා හැටියට වැඩ කළා. ඊට අමතරව ඡායාරූප ශිල්පියෙකු හැටියටත් යම් යම් කාර්යයන් වල නිරත වුණා. මේ කාලයේ දී තිර රචනය පිළිබඳ පාඨමාලාවක් මම හැදෑරුවා. එහි ප්‍රතිඵලයක් හැටියට චරිත තුනක් ටෙලි නාට්‍යයේ සහය අධ්‍යක්ෂවරයෙක් හැටියට වැඩ කරන්න ලැබුණා. මෙය රූපගත කළේ ගම්පහ ප්‍රදේශයේ. මම හැම සෙනසුරාදා ඉරිදාවකම මේ ටෙලි නාට්‍යයේ සහය අධ්‍යක්ෂණයේ නිරත වුණා. මෙහෙම යනකොට රදාවාන හන්දියේ තුං මං හන්දියේ පුංචි තේ කඩයක් තිබුණා. මෙතැන හැමෝම එක්තැන්වන තොරතුරු ගමටම බෙදා දෙන තැනක් වුණා. ඉතින් මම මේ තැනට ඉතාමත්ම ප්‍රිය කළා. මේ වෙබ් අඩවිය පටන් ගන්කොට මට මේ තැන මතක් වෙලා මම මේකට තුංමංසල කියලා නම් කළා.

**ශ්‍රීනාත්**
තුංමංසල වෙබ් අඩවියේ ඇතුලත් වන දේවල් මොනවාද?

**උදය**
ප්‍රධාන වශයෙන් ප්‍රවෘත්ති. වෙබ් රේඩියෝව. එක් එක් කලා ශිල්පීන් වෙනුවෙන් වෙන් වුණ පිටු. මේ පිටු වල ඔවුන්ගේ විස්තර සහ නිර්මාණ ඇතුලත් වෙනවා. ඔස්ට්‍රේලියාවේ ශ්‍රී ලාංකික සමාජයේ විවිධ ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු සහ ඒවායේ ඡායාරූප. අන්තර්ජාල නාමාවලිය. දූ දැරුවන්ගේ නිර්මාණ පිටුව. වෙනත් මාධ්‍ය සඳහා පිවිසිය හැකි සම්බන්ධතා වැනි බොහෝ දේ තුංමංසලින් බෙදා දෙනවා.

**ශ්‍රීනාත්**
ඔබ 2205 මැතිවරණයෙදි තුංමංසලින් විශාල වැඩ කොටසක් කළා නේද?

**උදය**
ඔව්. ඒ ගැන මතක් කරන්න ඕනෙ. මට ඕනෙ වුණා අලුත්ම තොරතුරු එසැණින් ම අපේ ජනතාවට ගෙනෙන්න. මොකද ඒ වකවානුවේ හැමෝම ජනාධිපතිවරණය ගැන දැඩි උවමනාවකින් හිටියෙ. ඉතින් මේ වෙලාවෙදි මට ලංකාවෙ සිටින ප්‍රවීණ මාධ්‍යකරුවන් වන දයා ලංකාපුර කුසුම්චන්ද්‍ර අරංගල මයුරි අබේසිංහ සුරේන්ද්‍ර තිලකරත්න වැනි අය උදව් වුණා. ඒ එක්කම මෙයට විශාල මුදලක් සහ කාලයක් වැය කරන්න සිදුවුණා. මේ වෙලාවෙ මට වෙළඳ ව්‍යපාරික මහතුන් කීපදෙනෙක් අනුග්‍රහය දැක්වුවා. ඒ කාලයේදී වෙබ් අඩවියට ගොඩවෙච්ච සංඛ්‍යාව 133000 කට වැඩියි. ඒකෙන් පේනවා නේද අපේ අය කොයි තරම් උනන්දුවෙන් ඒ ගන බලන් හිටියද කියලා. ඉතින් මම සතුටු වෙනවා මගේ ව්‍යායාමය සාර්ථක වීම පිළිබඳව.

**ශ්‍රීනාත්**
ඔබ කොහොමද මේ පරිගණක තාක්ෂණයට යොමු වුණේ?

**උදය**
ඒකත් හොඳ ප්‍රශ්නයක්. මම මුලින්ම මාධ්‍යයට සම්බන්ධ වෙලා වැඩ කරනකොට අපි වැඩ කළේ පරිගණක තාක්ෂණයෙන් නෙවෙයි. ඇනලොග් ක්‍රමයටයි. මෙහෙට ආවට පස්සෙ මම පරිගණක තාකාෂණය ඉගෙන ගත්තා. මම දැන් රැකියාව කරන්නෙත් පරිගණක තාක්ෂණයට (Network Engineering) සම්බන්ධවයි.

**ශ්‍රීනාත්**
අපි දන්නවා මේ වගේ වැඩක් කරන්න විශාල කාලයක් වැය වන බව. කොහොමද ඔබ මේ කාලය හොයා ගන්නෙ?

**උදය**
මම මේ සඳහා විශාල කැපවීමක් කරනවා. හැමදාම පාන්දර තුනට පමණ අවදි වෙලා මෙය අප්ඩේට් කරනවා. කිසිම ප්‍රතිලාභයක් බලාපොරොත්තුවෙන් නෙවෙයි මම මේක කරන්නෙ. ඔබ දන්නවා කලාකරුවෙක් හැටියට හැම නිර්මාණයකින්ම අපට ලැබෙන්නෙ ආත්ම තෘප්තිය පමණක්ය යන කාරණය. ඒ ආත්ම තෘප්තිය මිල කළ නොහැකියි. ඒ එක්කම මෙය නරඹන අය දක්වන ප්‍රතිචාර නිසා ඒ මහන්සිය අමතක වෙලා යනවා. ඒ එක්කම මගේ පිටිපස-'සෙන් හැම වෙලාවෙම මෙයට අනුබල දෙන මගේ බිරිඳ නාලනී ගෝවින්නත් සෙනෙහසින් මතක් කරනවා.

### මුහුණට මුහුණ

**ශ්‍රීනාත් මද්දුමගේ**

**ශ්‍රීනාත්**
ඉදිරි බලාපොරොත්තු මොනවාද?

**උදය**
තුංමංසල තවත් දියුණු කිරීම සහ ඒතුළින් තව තවත් විවිධ කරුණු කාරණා තුංමංසලට ගොඩ වන ශ්‍රී ලාංකිකයන්ට ලබා දීම. ඒ එක්කම මම කැමතියි කියන්න මට නොපෙනෙන ඔබට පෙනෙන යම් කිසි වෙනස් කමක් කිරීමට ඇත්නම් ඒ බව මට දන්වන්. මම ඒ හැම කාරණයක්ම සැළකිල්ලට ගන්නවා. ඒ එක්කම මට මතක් කරන්න අවශ්‍යයි තුංමංසල ගුවන් විදුලිය ආරම්භ කරන කාලයේ එහි තේමා වාදනය සකස් කර දුන් රෝහණ ධර්මකීර්ති. හේමපාල ගාල්ලගේ හා දයා සිල්වා යන මහත්වරු. ඊට අමතරව වෙබ් අඩවියට අවුරුද්දක් පිරුණ දින තුංමංසල ගීතය නමින් ගීතයක් නිර්මාණය කර මට එවූ මට කවදාවත් හමුවෙලා නැති මිත්‍ර සිරිමාන්න සහෘදයාවත් මතක් කරන්න කැමතියි.

**ශ්‍රීනාත්**
තුංමංසල වෙබ් අඩවිය තව තවත් ඉදිරියට ගෙන යන්නට ඇති ඔබේ අදිෂ්ඨානය සඵල වෙන්යි කියලා මම සන්නස වෙනුවෙන් සුබ පතනවා.


